# ගොවිතැන් පුහුණු කිරීමේ වැඩ සටහන්

* එස්. නටේසන් විසිනි

## හොඳින් ගොවිතැන් කිරීමට පුහුණුව අවශ්‍යද?

තමන්ගේ යැපීම් සඳහා ඕනෑ කරන දේවල් පමණක් නිපදවා ගැනීමට ගොවීන් ගොවිතැන් කරන අවස්ථාවලදී පුහුණුවකින් ඒ තරම් වටිනා කමක් ලැබෙන්නේ නැහැ.

ඒ වුනත් අද ගොවිතැන පිළිබඳව නොයෙක් වෙනස්කම් බොහෝ ඉක්මණින් සිදු වෙනවා. මේ කාලයේ ආහාර හිඟයි; මිල වැඩියි; ඒ අතරම ජනගහනයත් වැඩි වෙනවා. එහෙත් දියුණු වී ඇති කාර්මික ශිල්පය (වැඩි අස්වැන්නක් ගෙන දෙන බීජ වර්ග, පොර වර්ග, රසායනික ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ යනාදිය) නිසා ගොවිතැන දැන් හොඳ ලාබ ලබා ගත හැකි ව්‍යාපාරයක්. එය විද්‍යාත්මක පිළිවෙල කට කරගෙන ගියොත් අපේ ඕනෑ එපාකම්-හුඟක් පිරිමසා ගන්නට පුළුවන්. මේ වගේ අවස්ථාවලදී පුහුණුව හුඟක්ම වැදගත් වෙනවා.

## පුහුණුවකින් වැඩියෙන්ම පලප්‍රයෝජන ලැබෙන්නේ කාටද?

මේ වගේ පුහුණුවකින් වැඩියෙන්ම පලප්‍රයෝජන ලබන්නේ ඇත්ත වශයෙන් ගොවිතැන් කටයුතු වල යෙදී ඉන්න ගොවි ජනතාවයි. දියුණු වී ඇති කාර්මික ඥානය යොදා ගනිමින් ගොවිතැනින් බොහෝ මුදල් උපයන ගොවීන් පිළිබඳව අපි අසා තියෙනවා. විශේෂයෙන්ම සිය බෝග වර්ග සඳහා ඉතාමත් සතුටුදායක මිල ගණන් පවතින මෙවැනි කාලයක අනෙකුත් ගොවීන්ටත් මේ විදියටම වැඩ කරල හුඟක් ලාබ ලබා නොගන්නට හේතුවක් නැහැ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දැනට පිළියෙල කර තියෙන පුහුණුවීමේ වැඩ සටහන් වලට සහභාගී වෙලා බෝග වගාව ගැනත් සතුන් ඇති කිරීම ගැනත් අළුත්ම ක්‍රම ඉගෙන ගෙන තමන්ගේ ගොවිපලෙන් වැඩිම ලාබ ලබා ගැනීමට ගොවීන්ට දැන් පුළුවන්කම තියෙනවා.

තම තමන් ජීවත් වන ප්‍රදේශ වල ගොවිතැන වැඩි දියුණු කිරීමට නොයෙකුත් ගොවි සංවිධාන-වල නිලධාරීහු (කෘෂිකර්ම පලද වර්ධන කමිටු, විවිධ සේවා සමුපකාර සමිති, ගොවි කාරක සභා යනාදිය) දැන් කටයුතු කරනවා. ගොවිතැන පිළිබඳව දියුණු ශිල්ප ක්‍රම ගැන ලබාගන්නා පුහුණුව හැරෙන්නට ගොවිතැන වැඩිදියුණු කිරීමේදී මේ නිලධාරීන්ට භාර වෙලා තියෙන මග පෙන්වීමේ වැඩ කොටස ගැන අවබෝධයක් ලබා ගැනීමත් ඇත්ත වශයෙන් වැදගත්.

ගොවිතැන ගැන සලකනවිට තරුණ පිරිසත් අමතක නොකළ යුතුයි. ඔවුන් ඉදිරි කාලයේදී ගොවීන් හා නායකයන් වෙන්නට පුළුවන් නිසා තරුණයින් හොඳින් ගොවිතැනට හුරුපුරුදු කළ යුතුයි. නව ගොවි ජනපද යෝජනා ක්‍රම, ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල සහ සමුපකාර ගොවි පලවල් ආදිය නිසා ගොවිතැනට සහභාගි වීමට ඔවුන්ට හොඳ අවස්ථාවක් ලැබී තියෙනවා. නායකත්වය පිළිබඳ ක්‍රමානුකූල පුහුණුවීමේ වැඩසටහන්වලට ඔවුන්ට සහභාගිවිය හැකියි.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිළියෙල කර ඇති පුහුණුවීමේ වැඩසටහන්

ගොවීන්ගේ, ගොවි සංවිධානවල නිලධාරීන්ගේ, තරුණයින්ගේ සහ ගොවිතැනට සම්බන්ධ වෙනත් කණ්ඩායම්වල නොයෙකුත් උවමනා වලට ගැලපෙන විධියට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දැන් පුහුණු කිරීමේ වැඩ සටහන් පිළියෙල කර තියෙනවා.

## මෙම වැඩසටහන් නොයෙකුත් මට්ටමින් ලබා ගත හැකියි.

අ. ගොවීන්, නිලධාරීන් සහ තරුණයින් සඳහා සියළුම දිස්ත්‍රික්කවල ග්‍රාමීය සහ ගොවිකාරක සභා මට්ටමින්.

ආ. ගොවීන්, නිලධාරීන් සහ තරුණයින් සඳහා ඇතැම් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක මට්ටමින්.

---

* සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම ව්‍යාප්ති), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ඇ. තෝරා ගනු ලබන ගොවීන්,නිලධාරීන්, තරුණයින් සහ වෙනත් කණ්ඩායම් සඳහා ප්‍රාදේශීය මට්ටමින්.

ඈ. තෝරා ගනු ලබන ගොවීන්, තරුණයින්, නිලධාරීන් සහ වෙනත් කණ්ඩායම් සඳහා ජාතික මට්ටමින්.

අපේ ඕනෑඑපාකම් වලට සරිලන විධියට මේ පුහුණු කිරීමේ වැඩසටහන්වල ඇතුළත් කරුණු වෙනස් වෙනවා. වී, මිරිස්, ලූනු, බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු, සෝයා බෝංචි, මුංඇට, කඩල, පරිප්පු, කව්පි, එලවලු (උඩ රට හා පහත රට) පළතුරු සහ උක් නිෂ්පාදනය, ආහාර පිළියෙල කිරීම, නොයෙක් බෝග එකවර වගා කිරීම, මී මැස්සන් ඇති කිරීම, එලවලු බීජ නිෂ්පාදනය, තවාන් පාලනය කිරීම, පොම්ප සහ වතුර ඉසින යන්ත්‍ර නඩත්තුව සහ අළුත් වැඩියා කිරීම, මල් පැල සහ හතු වැවීම සහ කිරි පට්ටි පාලනය කිරිම ආදී නොයෙකුත් කරුණු ගැන පුහුණුව ලබා ගත හැකියි.

එක් එක් දේවල් ඕනෑ වෙන විදියට තව තවත් කරුණු මේවාට ඇතුළත් කරන්නට පුලුවන්.

ගොවිතැන් සඳහා එක් දිනක් සහ එක් සතියක් තුළ සිට මාස 3ක් සඳහා මේ පුහුණුවීමේ පන්ති පැවැත්වෙනවා. පුහුණුව ලැබීමට ඕනෑ කරන කාරණය අනුව තරුණයින් සඳහා එක් අවුරුදු සහ දැවුරුදු වෘත්තීය පුහුණුවක් වශයෙන්ද මේ පන්ති පවත්වා ගෙන යනු ලබනවා. ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ උපදෙස් යටතේ තම ගෙදරදීම සුළු ප්‍රමාණයේ ගොවිතැනකට සහභාගි වීමෙන් ගොවිතැන ගැන මූලික කරුණු ඉගෙන ගැනීමට තරුණ ගොවි සමාජ සාමාජිකත්වය ලබා ගැනීමෙන් තරුණයින්ට පුලුවන් වෙනවා.

මෙහිදී වඩාත් වැදගත් වන්නේ ගොවීන්ගේ, නිලධාරීන්ගේ සහ තරුණයින්ගේ ඕනෑඑපාකම් වලට ගැලපෙන විධියට මෙම පුහුණු කිරීමේ වැඩ සටහන් වෙනස් කර ගැනීමට ඇති හැකියාවයි. මෙම වැඩ සටහන් පිළිබඳව ඔබ සැලකිල්ලක් දක්වන්නේ නම් ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානයෙන් ඒ පිළිබඳව දැන ගැනීමට ඔබට පුලුවනි. ඔබට ඕනෑ කරන කරුණු ඔබේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක හෝ කෘෂිකර්ම උපදේශක තැන ඔබට ලබා දෙනවා ඇති.

---

# ගොවි කටයුතුවලදී දක්වුනු අදහස් කෙටියෙන්

1. ගොවි කටයුතු කරන ප්‍රදේශවල දැනට ඇති කුඩා වැව් අලුත්වැඩියා කර ඒවා හොඳින් නඩත්තු කරමින් පවත්වා ගෙන යනු ලැබේ නම් එවැනි ප්‍රදේශ බොහොමයක ජලය ලබා ගැනීමේ දුෂ්කරතා අඩු කර ගැනීමට පුළුවන. වැසි ජලයෙන් ගොවිතැන් කරන ප්‍රදේශ වල ජලය අපතේ යා නොදී ආරක්ෂා කර ගත හැක්කේ අමුණු සෑදීමෙනි.

2. වතුර පිළිබඳ අවිශ්වාස දයක තත්වය නිසා කන්න තුනකින් එකක් නොකඩවාම පාලු වෙයි. ගොවීන් සමුපකාර සංගම්වලින් ලබා ගන්නා ණය ඔවුන්ගේ සියළුම ගොවිකටයුතුවලට ප්‍රමාණවත් නොවන අතර මේ හේතුකොට ගෙන පෞද්ගලික ණය හිමියන් වෙත යාමට ඔවුන්ට සිදුවෙයි. වගාවන් පාලුවීම හේතුකොට ගෙන බොහෝවිට තමන්ගේ සියළුම ණය මුදල් ආපසු ගෙවීමට ගොවීන්ට නොහැකි වෙයි. අස්වැන්න කපා පාගා ගන්නා අවස්ථාවේදී පෞද්ගලික ණය හිමියා නොවරදවාම ගොවීන් වෙත පැමිණෙන හෙයින් පළමු කොටම ඔහුගේ මුදල් ගෙවීමට ගොවීන්ට සිදුවෙයි. ඔහුට හිමි මුදල් ගෙවා ඉවර වූවාට පසු අනෙකුත් ණය දෙන ආයතන වලින් ලබාගත් ණය මුදල ගෙවීමට කිසිවක් ඉතිරි නොවේ. කලට වේලාවට ප්‍රමාණවත් ණය මුදලක් දී, එම මුදල් පරිහරණය කරන සැටි සොයා බලා එය ආපසු ලබා ගැනීමට රජයේ ණය දෙන ආයතන වැඩ පිළිවෙලක් සකස් කරන්නේ නම් ගොවියාගේ තත්වය මීට වඩා යහපත් වන අතර ණය ගෙවීම පැහැර හරින්නන්ගේ සංඛ්‍යාවද අඩු වනු ඇත.

3. සෑම ගොවි කාරක සභාවකම වැඩ කටයුතු එකසේ සතුටුදයක නොවේ. ඇතැම් ගොවිකාරක සභා හොඳින් කටයුතු කරන අතර අනෙක්වා එසේ නොවේ. දැනට සිටින සාමාජිකයන් වෙනුවට වෙනත් සාමාජිකයින් තෝරා ගන්නා තෙක් අයහපත් තත්වයක පවතින ගොවි කාරක සභා පිළිබඳව කළහැකි කිසිවක් නොමැත.

4. සමුපකාරවලද ක්‍රියාකාරිත්වය එක සමාන නොවේ. පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය වැනි අවශ්‍ය දේවල් අවශ්‍ය වේලාවට ලබා ගත නොහැකි වන අතර මේ හේතු කොටගෙන ගොවිතැනට බාධා පැමිණේ.

5. විශේෂයෙන් යූරියා වැනි පොහොර රාත්තල් 56 සහ රාත්තල් 112 විශාල මලු වල දමා විකුණනු ලැබේ. එහෙත් ගොවියාට සිය තවාන සඳහා යූරියා අවශ්‍ය වන්නේ සුලු වශයෙනි. මේ වෙනුවට රාත්තල් 7, 14 සහ 28 මලුවල පොහොර දමා තිබේ නම් එය වඩාත් පහසු වන්නේය. එමෙන්ම පොහොර පාවිච්චි කරන පිළිවෙල සම්බන්ධයෙන් උපදෙස් පත්‍රිකාවක් ද මේ මලු තුළ බහා ලිය හැක.

6. වී ගබඩා කිරීමට පහසුකම් නැති නිසා ඇතැම් සමුපකාර වී මිළදී නොගනී. එවිට පෞද්ගලික වෙළෙන්දන්ට වී විකිණීමට ගොවීන්ට සිදුවන අතර අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නා පෞද්ගලික වෙළෙන්ද ගොවීන්ගේ වී ඉතාමත් අඩු මිලකට ලබාගනී.

7. මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල ගැටළුවක්ව ඇත්තේ සීසෑම සඳහා ඇති තරම් මීහරක් නොසිටීමයි. එසේම උදලු හිඟකමද ගැටලුවකි. ලංකාවේ සාද ඇති උදලු හොඳින් හිතා මතා නිර්මාණය කර නැති බව අපට පෙන්වා දෙන ලදී.

8. ගොවීන්ට හුරු පුරුදු කෘෂි රසායනික ද්‍රව්‍ය වෙනුවට අලුත් කෘෂි රසායනික ද්‍රව්‍ය ගොවීන්ට විකුණනු ලැබේ. කෘෂි රසායනික ද්‍රව්‍යයක හොඳ බව ඔප්පුවී එය බොහෝ දෙනා පිළිගන්නා තෙක් අලුත් කෘෂි රසායනික ද්‍රව්‍යයන් භාවිතා කිරීමට ගොවීහු මැළිකමක් දක්වති.

9. ගම්වල විනෝද පහසුකම්, ක්‍රීඩා, සාජ්පු යනාදිය තිබේනම් ගොවිතැන් කටයුතු කරගෙන යාමට බොහෝ තරුණයෝ කැමැත්තක් දක්වති.

10. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ගොවි වැඩ සටහන් ප්‍රයෝජනවත්ය. එහෙත් ගොවීන් ද වැඩ සටහන්වලට සහභාගි කරවා ගෙන විශේෂඥයින් සමග රටෙහි ගොවිතැන් තත්වය පිළිබඳ සාකච්ඡා කරන්නේ නම් එම වැඩසටහන් වඩාත් වැඩදයක වනු ඇත.

11. කෘෂිසේවා මධ්‍යස්ථානය මහඟු ආයතනයකි. එය හොඳින් ක්‍රියාකාරී වූවොත් ගොවියාට සිදුවන සේවය ඉමහත්ය. සමාන තත්වයේ නිලධාරීන් එහි සේවය සඳහා යෙදවිය යුතුවෙයි. නිදසුනක් වශයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරියෙකු එහි සේවය කරයි නම්, කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයකු වෙනුවට එහි සිටිය යුත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික උපදේශක වරයෙකි. මෙම ඇතැම් මධ්‍යස්ථාන සුදුසු ස්ථානවල පිහිටා නොතිබෙන අතර අවසාන වශයෙන් කෘෂිසේවා මධ්‍යස්ථානයක තිබිය යුතු තත්වය තෙක් දියුණු වීමට ඉඩ පහසුකම් එම මධ්‍යස්ථානවලට නොමැත.

12. වගා නිලධාරීන් සහ ඉඩම් සංවර්ධන පරීක්ෂක නිලධාරීන් වැනි නිලධාරීන් බොහෝ සංඛ්‍යාවක් විවිධ දිස්ත්‍රික්කයන්හි සිටින අතර කෙටි පුහුණුවකින් පසු ඔවුන් ද කෘෂිකර්ම නිෂ්පාදන ප්‍රයත්නයන්ට සහභාගි කරවා ගත හැක. දැනට මෙම ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් වැඩි හරියක් එකිනෙකාගෙන් වෙන්ව සේවය කරති.

13. වැදගැම්මකට නැති රැස්වීම් ගොවියාට හිසරදයක් වී තිබේ. රැස්වීම් වලින් වැඩදයක සේවයක් ඉටු කර ගත හැකිනම් ඇත්තෙන්ම ගොවීන් ඒවාට සහභාගිවීමට උනන්දුවක් දක්වනු ඇත.

14. කෘෂිකර්ම ඉඩම් පනත හේතු කොට ගෙන අතිරේක ඉඩම් වගා කරනු ලැබේ. නිදර්ශනයක් වශයෙන් අනුරාධපුරයෙහි භුක්තිය පිළිබඳ ගැටළු හේතුකොටගෙන අවුරුදු ගණනාවක් තුළ පුරන්ව තිබූ පුරාණ ඉඩම් අක්කර දෙදහක් පමණ දැන් වගා කරගෙන යනු ලැබේ.

15. ඉසින යන්ත්‍ර හිඟයක් ඇත. යටත්පිරිසෙයින් සෑම අක්කර 50 කටම එකක් වශයෙන් වත් කුලියට ලබා ගත හැකි වන පරිදි ඉසින යන්ත්‍ර තිබිය යුතුය.

කිවයුතු කරුණු : ඉහත සඳහන් කර ඇති අදහස් පිළිබඳව දක්වනු ලැබෙන නිරීක්ෂණ ''ගොවි ජනතාව'' සඟරාවේ ඊළඟ කලාපයේ ඇතුළත් වනවා ඇත.